# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம்,கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01 Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94) -11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date: 2022 –04 - 19

**<u>ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ රැස්වීම (අප්‍රේල් 18)</u>**

මුදල් අමාත්‍ය ජනාධිපති නීතිඥ එම්.යූ.එම් අලි සබ්රි මහතා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) කළමනාකාර අධ්‍යක්ෂිකා Kristalina Georgieva මහත්මිය සමඟ අප්‍රේල් 18 වන දින වොෂින්ටන් හි IMF මූලස්ථානයේ දී හමු විය. ශ්‍රී ලංකාවේ මූල්‍ය අර්බුදය සමනය කිරීම සඳහා ගරු මුදල් අමාත්‍යවරයා විසින් දැනටමත් ගෙන ඇති පියවර පිළිබඳ ව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පැසසුමට ලක් විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ශ්‍රී ලංකාවට තම උපරිම සහයෝගය ලබා දෙන බවට සහතික වී ඇති අතර ශ්‍රී ලංකාව වෙත ලබා දෙන සහයෝගය ශක්තිමත් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා ධනාත්මක ප්‍රතිචාරයක් ද ලැබී තිබේ.

මුදල් අමාත්‍යවරයා IMF වෙතින් කඩිනම් මූල්‍ය සහනයක් ලෙස Rapid Financing Instrument (RFI) සඳහා ඉල්ලීමක් කර ඇති අතර IMF විසින් අමාත්‍යවරයා වෙත දන්වා ඇත්තේ RFI සඳහා ඉන්දියාව ද ශ්‍රී ලංකාව වෙනුවෙන් පෙනී සිටි බවයි. RFI නිකුත් කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ සම්මත නිර්නායකයන්ගෙන් බැහැරව වුව ද ඔවුන් විසින් එම විශේෂ ඉල්ලීම සලකා බලනු ඇති බව දන්වා තිබුණි.

ඉන්දීය මුදල් අමාත්‍ය නිර්මලා සීතාරාමන් සහ ඉහළ පෙළේ ඉන්දීය ආර්ථික දූත පිරිස අප්‍රේල් 18 වැනි දින වොෂින්ටන් හි IMF මූලස්ථානයේ දී මුදල් අමාත්‍ය අලි සබ්රි මහතා හමුවිය. ශ්‍රී ලංකාවට ඉදිරියට යාමට ඉන්දියාවෙන් උපරිම සහයෝගය ලබා දෙන බවට සීතාරාමන් මහත්මිය විසින් අමාත්‍ය අලි සබ්රි මහතාට සහතික වී ඇති අතර ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ සංවර්ධනය ශක්තිමත් කිරීමට සහ ජාතීන් එක් ව ඉදිරියට ගමන් කිරීමේ දී ශක්තිමත් බැඳීම් ගොඩනැගීමට ඉන්දියාව දක්වන කැපවීම පිළිබඳ ව අවධාරණය කර තිබේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව සිදු කරන සාකච්ඡා සඳහා විශේෂයෙන් ම විස්තීරණ අරමුදල් පහසුකම් කඩිනම් කිරීම සඳහා කරන ලද විශේෂ ඉල්ලීම සම්බන්ධයෙන් ඉන්දියාව විසින් පූර්ණ සහාය ලබා දෙන බව ඉන්දීය මුදල් අමාත්‍යවරිය අලි සබ්රි අමාත්‍යවරයා වෙත තහවුරු කර ඇත.

අද (2022 අප්‍රේල් 19) තවත් සාකච්ඡා වට කිහිපයක් පැවැත්වීමට තවදුරටත් කටයුතු යොදා ඇත. මෙම රැස්වීම් සඳහා භාණ්ඩාගාර ලේකම් මහින්ද සිරිවර්ධන සහ මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ යන මහත්වරු ද සහභාගි වූහ.

**මාධ්‍ය ඒකකය**

**මුදල් අමාත්‍යාංශය**